# Abstract No 56

## යෝගාචාරවිඥානවාදි දර්ශනයේ දැක්වෙන, ආලය විඥානය සඳහා යෙදී ඇති පර්යාය පදයන්ගේ විවිධත්වය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්.

**පූජ්‍ය කරපික්කඩ සෝභිත හිමි**
උපශාලාධිපති, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.
karapikkadasobitha@gmail.com

"යෝගාචාරවිඥානවාදය" යනු මහායාන බෞද්ධ සම්ප්‍රදායෙහි ශ්‍රේෂ්ඨ දාර්ශනික ගුරුකුලයක මුඛ්‍ය ඉගැන්වීමකි. වෛඥානිකත්වය පදනම් ව භෞතිකත්වයේ ස්වභාවය හා පැවැත්ම පිළිබඳ විශ්ලේෂණයන් මේ තුළ ඉදිරිපත් වී ඇත. එමෙන් ම ක්ලේෂ, වාසනා, චෛතසික ආදි වූ ධර්මයන්ගේ ද පැවැත්ම හා ක්‍රියාකාරීත්වය උක්ත සම්ප්‍රදායානුගත ව විඥානය පදනම් ව විග්‍රහ වේ. මෙහි දැක්වෙන්නා වූ වෛඥානික ක්‍රියාවලිය තුළ නොයෙකුත් ප්‍රභේදයන් ප්‍රකට වන අතර, එහි ප්‍රමුඛ ඉගැන්වීම වනුයේ ආලය විඥානය යි. සියලු විඥානයන් අතර ප්‍රමුඛ වන ආලය විඥානය හැඳින්වීම සඳහා යෝගාචාර දර්ශනයේ මෙන් ම, මහායාන සූත්‍ර සාහිත්‍යයේ ද පර්යාය පද රාශියක් යෙදී ඇත. එසේ ම එම පදයන්ගේ අර්ථයන් පිළිබඳ විමසීමේ දී ආලය විඥානයේ භාවිතාව හා ක්‍රියාකාරීත්වය යෙදී ඇත්තේ විවිධාකාර ලෙසින් බව පෙනේ. යෝගාචාර විඥප්තිමාත්‍රතාසිද්ධිවාදයෙහි ආලය විඥානය සඳහා **"සර්ව බීජක"** පදය යෙදී ඇති අතර, ඒ තුළින් සියලු ක්ලේෂ බීජයෝ එහි තැන්පත් ව ඇති බව දක්වා ඇත. එනම්, වාසනාබීජ, මූලබීජ, අනාශ්‍රවබීජ, කර්මබීජ, ක්ලේෂබීජ, ස්මෘතිබීජ ආදිය යි. එසේ ම ආචාර්ය අසංගපාදයෝ මේ සඳහා **"ආදාන විඥාන"** යන පදය යොදා ඇත. ඒ තුළ ආලය විඥානය "ගෘහය" යන අරුතින් දක්වා ඇත. වස්තු රැස් කරන්නා වූ ස්ථානය ගෘහය යි. සියලු වාසනාවන් රැස් කරන බැවින් ආලය විඥානය ද ගෘහයක් මෙන් ක්‍රියාත්මක වන බව මෙයින් දක්වා ඇත. මීට අමතර ව උප්පත්ති මරණද්වය ඇති කරවන කුශලාංශය කර්මයන්ගේ විපාක ඵලයන් මෙහි අන්තර්ගත බැවින් ආලය විඥානය **"විපාකඵලය"** ලෙස ද, ඉතා පිරිසිදු අනාශ්‍රව ධර්මයන්ට ආශ්‍රය වන බැවින් **"විමල විඥානය"** ලෙස ද දක්වා ඇත. යෝගාචාර විඥානවාදය තුළ **පරමාලයවිඥානය, විඥප්තිආලය** යනුවෙන් විග්‍රහවන්නේ ද මෙම ආලය විඥානයේ ම ක්‍රියාකාරීත්වය යි. එසේ ම මෙම පර්යාය පදයන්ට අමතර ව මහායානසූත්‍ර සාහිත්‍යය තුළ උක්ත විඥාන ධර්මය හැඳින්වීම සඳහා **ආශ්‍රය විඥාන, බීජ විඥාන, චිත්ත විඥාන** යන පදයන් ද යෙදී ඇති අයුරු දැක ගත හැකිය. මේ අතර ආර්ය ලංකාවතාර සූත්‍රය ආලය විඥානය සඳහා යොදා ඇත්තේ **"තථාගත ගර්භ"** යන පදය යි. ක්‍රමවත් ව, අවිච්ඡින්න ව, අඛණ්ඩ ව පැමිණි ගර්භය යනු එහි අදහස යි. අපගේ මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ආලය විඥානය සඳහා යෙදී ඇති පර්යාය පදයන් තුළ එහි ක්‍රියාකාරීත්වය කෙසේ සිදුවන්නේදැයි විමර්ශනාත්මක ව අධ්‍යයනය කිරීමට අපේක්ෂිත ය.

**ප්‍රමුඛපද ;** විඥානය, ධර්ම, ක්ලේෂ, ආලය, තථතාව.